# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1901/9 - 2015 පෙබරවාරි මස 10 වැනි අඟහරුවාදා - 2015.02.10

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

**1992 අංක 04 දරන ශ්‍රී ලංකා පුරාවිද්‍යාඥයින්ගේ සභාව (සංස්ථාගත පනත)**

1992 අංක 04 දරන ශ්‍රී ලංකා පුරාවිද්‍යාඥයින්ගේ සභාව (සංස්ථාගත) පනතේ 06 (01) වැනි වගන්තිය යටතේ 1995 ජනවාරි 17 වැනි අඟහරුවාදා අංක 854/6 ශ්‍රී ලංකා ප්‍රජාත්‍රාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශේෂ ගැසට් පත්‍රයේ* පල කරන ලද ශ්‍රී ලංකා පුරාවිද්‍යාඥයින්ගේ සභාව නමින් පිළියෙල කරන ලද නීති මාලාව සභාවේ අණ පරිදි අවලංගු කරන අතර ශ්‍රී ලංකා පුරාවිද්‍යාඥයින්ගේ සභාව නමින් පිළියෙල කරන ලද නව නීති මාලාව පණවනු ලැබේ.

සභාවේ අණ පරිදි,

මහාචාර්ය ගාමිණී අධිකාරි,
ශ්‍රී ලංකා පුරාවිද්‍යාඥයින්ගේ සභාවේ
පාලක මණ්ඩලයේ සභාපති.

2015 පෙබරවාරි මස 10 වැනි දින,
පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව,
කොළඹ 07.

ශ්‍රී ලංකා පුරාවිද්‍යාඥයින්ගේ සභාව පනතේ 6 (1) වැනි වගන්තියේ ප්‍රකාර සම්පාදිත නව ව්‍යවස්ථාවලිය

01. *(අ)* සභාවේ සහය සාමාජිකයෙකු ලෙස ඇතුළත් කර ගැනීම සඳහා සමත් විය යුතු සුදුසුකම් ලැබීමේ පරීක්ෂණ වශයෙන් මෙම ව්‍යවස්ථාවලියේ දෙවැනි උප ලේඛනයේ නියම කර ඇති සුසුකම් ලැබීමේ පරීක්ෂණ වලින් හෝ එම පරීක්ෂණ හා සමාන බවට සභාව විසින් තුනෙන් දෙකේ බහුතර ඡන්දයෙන් සම්මත කර ඇති වෙනත් පරීක්ෂණයකින් නොහොත් පරීක්ෂණ වලින් හෝ සාමාර්ථය ලබා ඇති කවර තැනැත්තකු වුව ද (මෙහි මින් මතු මණ්ඩලය යනුවෙන් හඳුන්වනු ලබන) පාලක මණ්ඩලය විසින් සභාවේ සහය සමාජිකයෙකු වශයෙන් ඇතුළත් කර ගනු ඇත.

*(ආ)* පිළිගත් විශ්වවිද්‍යාලයක හෝ ආයතනයක පුරාවිද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධියක් හා අධි සාමාජිකයෙකුගේ අධීක්ෂණය යටතේ සුදුසු රාජ්‍ය හෝ පෞද්ගලික ආයතනයක වෘත්තීය පුරාවිද්‍යාඥයකු වශයෙන් දෙවසරක පළපුරුද්දක් ලබා ඇති කවර තැනැත්තකු වුව ද මණ්ඩලය විසින් සභාවේ සමාජිකයෙකු වශයෙන් ඇතුළත් කර ගනු ඇත.

*(ඇ)* දස වර්ෂාධික කාලයක් තුළ සභාවේ සාමාජිකයෙකු ලෙස සාමාජිකත්වය දරා ඇති යම් තැනැත්තෙකු මණ්ඩලය විසින් සභාවේ අධි සාමාජිකයෙකු වශයෙන් ඇතුළත් කර ගනු ඇත.



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

02. (අ) සභාවේ සංස්ථාගත නොවන සාමාජික සංඛ්‍යාව ගරු සාමාජික, ලියාපදිංචි සාමාජික හා ශිෂ්‍ය සාමාජික යන අයවළුන්ගෙන් සමන්විතය. තම නියෝජනය සඳහා ඡන්දය දීමේ අයිතිය ඔවුනට ඇත.

(ආ) සභාවට හෝ වෘත්තියට අගනා සේවාවක් සලසා ඇති තැනැත්තෙකු මණ්ඩලය විසින් ගරු සාමාජිකයෙකු වශයෙන් ඇතුළත් කර ගත හැකිය. එතෙකුදු වුවත් එක් වර්ෂයක දී ගරු සාමාජිකයන් එක්කෙනෙකුට වඩා සභාව විසින් ඇතුළත් කර නොගත යුතු අතර ගරු සාමාජිකයින්ගේ මුළු ගණන කවර අවස්ථාවක දී වත් දහ දෙනෙකුට වැඩි නොවිය යුතුය.

(ඇ) සභාවේ ලියාපදිංචි සාමාජිකයෙකු ලෙස ඇතුළත් කර ගැනීම සඳහා සමන්විත විය යුතු සුදුසුකම් ලැබීමේ පරීක්ෂණ වශයෙන් මෙම ව්‍යවස්ථාවලියේ දෙවැනි උප ලේඛනයේ නියම කර ඇති සුසුකම් ලැබීමේ පරීක්ෂණවලින් සාමාර්ථය ලබා ඇත්තා වූද, පුරාවිද්‍යා සංවිධානයක හෝ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ හෝ ඒ හා සමාන බවට සභාව විසින් පිළිගෙන ඇති අභ්‍යන්තර සංවිධානයක හෝ නොකඩවා දස වර්ෂයක් වත් ප්‍රායෝගික වශයෙන් පුරාවිද්‍යා විෂයෙහි වූ වගකීම් සහිත තත්ත්වයක ව්‍යාපෘතිව ඇත්තා වූ ද තැනැත්තකු මණ්ඩලය විසින් ලියාපදිංචි සාමාජිකයකු වශයෙන් ඇතුළත් කර ගනු ඇත.

(ඈ) ශිෂ්‍ය සාමාජිකයෙකු වශයෙන් ඇතුළත් කර ගැනීම සඳහා මෙම ව්‍යවස්ථාවලියේ දෙවැනි උප ලේඛනයෙන් නියම කර ඇති සුදුසුකම් හෝ ඒ හා සමාන බවට මණ්ඩලය විසින් පිළිගෙන ඇති අභ්‍යන්තර සුදුසුකම් හෝ ලබා ඇති යම් තැනැත්තකු මණ්ඩලය විසින් ශිෂ්‍ය සාමාජිකයෙකු වශයෙන් ඇතුළත් කර ගනු ඇත.

03. (අ) කවර පන්තියක හෝ සාමාජිකත්වයට ඇතුළත් කර ගැනීම සඳහා වූ අයදුම්පතක් සංස්ථාගත සාමාජිකයින් තිදෙනෙකුගේ වගකීම් සහිතව මණ්ඩලය විසින් විටින් විට නියම කරනු ලබන ආකෘති පත්‍රයෙහි පිළියෙල කොට ඉදිරිපත් කළ යුතුය අධි සාමාජිකත්වයට ඇතුළත් කර ගැනීම සඳහා වූ අයදුම්පතක් නම් එම අයදුම්පත ඉදිරිපත් කළ යුත්තේ අධි සාමාජිකයන් දෙදෙනෙකුගේ අනුග්‍රහය ඇතිවය.

(ආ) මණ්ඩලය මගින් සාමාජික ලේඛනයක් පවත්වා ගෙන යනු ඇත.

04. සභාව විසින් විටින් විට නියම කරනු ලබන ආකාරයට හා සැලැස්මට අනුව පිළියෙල කළ සාමාජිකත්ව සහතිකයක් මණ්ඩලය විසින් සෑම සාමාජිකයකු වෙතම සභාවේ පොදු මුද්‍රාව සහිතව නිකුත් කරනු ඇත. එම සහතිකය සභාව සතු දේපළක්ව පැවතිය යුතු අතර සාමාජිකයාගේ අභාවය හැර අන් හේතුවකින් ඔහුගේ සාමාජිකත්වය අවසන් වූ විට ඉන් සත් දිනක් ඇතුළත එය සභාව වෙත ආපසු භාර දිය යුතුය.

05. යම් අයෙකු තමාගේ සියළු හිඟදායක මුදල් හා ගාස්තු ගෙවීමෙන් ඉක්බිති තම සාමාජිකත්වයෙන් ඉල්ලා අස්වීමේ අභිමතය ගරු ලේකම් නමට ලිඛිතව දැනුම් දුනහොත් ඔහුගේ සාමාජිකත්වය අවසන් වනු ඇත.

06. ඉල්ලා අස් වීමෙන් සාමාජිකත්වය අවසන් වූ තැනැත්තකු නව සාමාජිකයෙකු වශයෙන් තමා සාමාජිකත්වයෙන් ඉවත් වන අවස්ථාවේ දී දැරූ සාමාජිකත්ව වර්ගයටම සභාව විසින් නැවත බඳවා ගත හැකිය.

07. (අ) ඇතුළත්වීමේ ගාස්තු, වාර්ෂික දායක මුදල් හා අනෙකුත් ගාස්තු ප්‍රමාණ මෙම ව්‍යවස්ථාවලියේ පළමු වැනි උප ලේඛනයේ නියමිත පරිදි වනු ඇත.

(ආ) කුමන හෝ වර්ගයක සාමාජිකත්වයට ඇතුළත් කර ගැනීම සඳහා මණ්ඩලය විසින් තීරණය කරනු ලබන තැනැත්තකු ඇතුළත් කර ගනු ලැබූ දින සිට දෙමසක් ඇතුළත එම වර්ෂය සඳහා වූ තම ඇතුළත් වීමේ ගාස්තුව හා වාර්ෂික දායක මුදල ගෙවිය යුතුය.

(ඇ) සෑම සාමාජිකයෙකු විසින් ගෙවිය යුතු වාර්ෂික දායක මුදල හා වාර්ෂික ගාස්තුවක් ඇතොත් එය පවත්නා වර්ෂයේ ආරම්භයට ප්‍රථම ගෙවිය යුතුය. වර්ෂයේ මාර්තු මස පළමු වැනි දින වන විට එය නොගෙවා ඇත්නම් ගරු භාණ්ගාරික විසින් එම සාමාජිකයාට සිහිපතක් එවනු ඇත. පවත්නා වර්ෂයේ ජුනි මස පළමු වැනි දින වන විට එය නොගෙවා තිබුණහොත් ගරු භාණ්ඩාගාරික විසින් එම සාමාජිකයා වෙත ලියාපදිංචි තැපෑලෙන් දැන්වීමක් එවනු ඇත. එම දැන්වීම එවා මාසයක් ඇතුළත යමකු හිඟ මුදල් නොගෙවුවහොත් ඔහුගේ සාමාජිකත්වය අවසන් වේ. එසේ නොගෙවා හැරීමට සෑහෙන හේතු තිබූ බව මණ්ඩලයට ඒත්තු ගියහොත් එකී තැනැත්තා සාමාජිකයෙකු වශයෙන් නැවත ඇතුළත් කර ගනු ඇත.

(ඈ) යම් සාමාජිකයෙක් වෘද්ධභාවය, රෝගී බව, බැරිකම හෝ වෙනත් ප්‍රමාණවත් හේතුවක් නිසා හෝ ස්වකීය වෘත්තියෙහි නිරතවීමට හෝ යම් ලාභදායි දිවිපෙවෙතක යෙදීමට හෝ නොසමත් වේ නම් මණ්ඩලය විසින් යෝජනාවක් සම්මත කොට ගෙන එම සාමාජිකයාගේ දායක මුදල සහමුලින්ම හෝ කොටස් මාත්‍රයකින් හෝ අත්හැර දැමිය හැකිය.

08 (අ) සභාවේ නිලධාරී මණ්ඩලය පහත සඳහන් අයගෙන් සමන්විත වනු ඇත :

i. ගරු සභාපති
ii. ගරු ආසන්නතම පූර්ව සභාපති
iii. ගරු ජ්‍යෙෂ්ඨ උප සභාපති
iv. ගරු උප සභාපති

v. ගරු සම ලේකම්වරු දෙදෙනයි (2)
vi. ගරු භාණ්ඩාගාරික
vii. ගරු උප භාණ්ඩාගාරික

(ආ) සභාවේ කාරක සභාව සභිකවරු එකොළොස් (11) දෙනෙකුගෙන් සමන්විත වේ.

පාලක මණ්ඩලය යතෝක්ත නිලධාරී මණ්ඩලයෙන් හා කාරක සභිකවරුන් ගෙන් සමන්විත වේ.

(ඇ) ගරු සභාපති, ගරු ජ්‍යෙෂ්ඨ උප සභාපති සහ ගරු උප සභාපති තනතුරුවලට අධි සාමාජිකයන් පමණක් සුදුසුකම් ලබනු ඇත.

(ඈ) ගරු සභාපති විය යුත්තේ ඉකුත් වර්ෂය අවසාන වන විට ගරු ජ්‍යෙෂ්ඨ උප සභාපති ධූරය දැරූ තැනැත්තාය. එවැනි සාමාජිකයෙකු පිට පිට ධුර කාල දෙකකට වඩා සභාපති ධූරය දැරිය යුතු නොවන නමුත් මණ්ඩල ධුර කාල දෙකක් ඉකුත් වූ පසු ඔහු එම ධූරයටම නැවත තෝරා පත් කර ගත හැකිය.

(ඉ) යටත් පිරිසයින් ධුර කාල දෙකක්වත් මණ්ඩලයට අයත්ව සේවය කර ඇති සංස්ථාගත සාමාජිකයෙකු පමණක් ගරු ජ්‍යෙෂ්ඨ උප සභාපති වශයෙන් තෝරාපත් කර ගැනීමට සුදුසුකම් ලබනු ඇත. එවැනි සාමාජිකයෙකු පිට පිට ධුර කාල දෙකකට වඩා ගරු ජ්‍යෙෂ්ඨ උප සභාපති ධූරය දැරිය යුතු නොවන නමුත් එක් මණ්ඩල ධුර කාලයක් ඉකුත් වූ පසු එම ධූරයටම ඔහු නැවත තෝරා පත් කර ගත හැකිය.

(ඊ) යටත් පිරිසයින් එක් ධුර කාලයක්වත් මණ්ඩලයට අයත්ව සේවය කර ඇති සංස්ථාගත සාමාජිකයෙකු පමණක් ගරු උප සභාපති වශයෙන් තෝරාපත් කර ගැනීමට සුදුසුකම් ලැබෙනු ඇතී එවැනි සාමාජිකයෙකු පිට පිට ධුර කාල දෙකකට වඩා ගරු උප සභාපති ධූරය දැරිය යුතු නොවන නමුත් ධුර කාල අවසන්වී එක් මණ්ඩල ධුර කාලයක් ඉකුත් වූ පසු එම ධූරයටම ඔහු නැවත තෝරා පත් කර ගත හැකිය.

(උ) ගරු ආසන්නතම පූර්ව සභාපති ඉකුත් ධූර කාලය අවසානයේ දී සභාපති ධූරය දැරූ තැනැත්තාය.

(ඌ) යටත් පිරිසයින් එක් ධුර කාලයක්වත් මණ්ඩලයට අයත්ව සේවය කර ඇති සංස්ථාගත සාමාජිකයකු පමණක් ගරු ලේකම්, ගරු සම ලේකම්, ගරු භාණ්ඩාගාරික හෝ ගරු උප භාණ්ඩාගාරික වශයෙන් තෝරා පත් කර ගැනීමට සුදුසුකම් ලබනු ඇත. එවැනි සාමාජිකයෙකු පිට පිට ධුර කාල දෙකකට වඩා දැරූ තනතුරක් නොදැරිය යුතු නමුත් එක් මණ්ඩල ධුර කාලයක් ඉකුත් වූ පසු නැවත තෝරාපත් කර ගත හැකිය.

(එ) මණ්ඩලයේ ගරු සභාපති, ගරු ආසන්නතම පූර්ව සභාපති, ගරු ජ්‍යෙෂ්ඨ උප සභාපති, ගරු උප සභාපති, ගරු සම ලේකම්වරු, ගරු භාණ්ඩාගාරික හා ගරු උප භාණ්ඩාගාරික තනතුරුවලට පත්වන සාමාජිකයින් හට පිට පිට ධුර කාල දෙකක් තමන් පත්වූ තනතුර ඡන්ද විමසීමකින් තොරව දැරිය හැකිය.

(ඒ) මණ්ඩලයේ එක් ධුර කාලයක් යනුවෙන් අදහස් වන්නේ වාර්ෂික මහා සභා රැස්වීම් දෙකක් අතර කාලයයි.

9. (අ) අධි සාමාජිකයෙකු පමණක් අධ්‍යයන මණ්ඩලයේ සභාපති වශයෙන් තෝරා පත් කර ගනු සඳහා සුදුසුකම් ලබනු ඇත. එවැනි සාමාජිකයෙකු පිට පිට ධුර කාල දෙකකට වඩා එම ධූරය නොදැරිය නමුත් එක් මණ්ඩල ධුර කාලයක් ඉකුත් වූ පසු එම ධූරයටම නැවත තෝරා පත් කරගත හැකිය.

(ආ) අධ්‍යන මණ්ඩලයේ සභාපති නිලබලයෙන් මණ්ඩලයේ සාමාජිකයෙක් වේ.

10. (අ) මණ්ඩලය නිලධාරී මඩුල්ල ද ඇතුළුව සාමාජිකයන් දහනවයකට නොවැඩි සංඛ්‍යාවකින් සමන්විත විය යුතු අතර එම සාමාජිකයන්ගෙන් එක් අයෙකු අධ්‍යන මණ්ඩලයේ සභාපති විය යුතුය.

(ආ) මණ්ඩලයේ සාමාජිකයන් තිදෙනෙකුවත් සහය සාමාජිකයන් විය යුතු අතර තිදෙනෙකුට නොවැඩි ගණනක් සංස්ථාගත නොවූ සාමාජිකයන් විය යුතුය.

(11) පූර්වෝක්ත නිලධාරීන් හා කාරක සභිකවරු අට දෙනෙකු තෝරාපත් කර ගැනීමේදී ඡන්දය ලැබීමට හිමිකම් ලැබිය යුත්තේ සංස්ථගත සාමාජිකන්ට පමණකි.

12. (අ) ලියාපදිංචි සාමාජිකයන්ට හා ශිෂ්‍ය සාමාජිකයන්ට මණ්ඩලයේ දී තමන් නියෝජනය කිරීම සඳහා පිළිවෙලින් අවම වශයෙන් එක් ලියාපදිංචි සාමාජිකයෙකු හා එක් ශිෂ්‍ය සාමාජිකයෙකු තෝරාපත් කර ගැනීමට හිමිකම් තිබිය යුතුය.

(ආ) එකී සාමාජිකයින්ට මණ්ඩලයේ රැස්වීම් වාර දන්වනු ලැබීමට හා ඊට සහභාගීවීමට ද හිමිකම් තිබිය යුතු නමුත් එහිදී ඡන්දය ප්‍රකාශ කිරීමට හිමිකම් නොතිබිය යුතුයි. ඔවුන් කිසිම විනයායානුකූල පරීක්ෂණයක දී හෝ ඊට අදාළ යම් කරුණක් පිළිබඳ සාකච්ඡාවක දී හෝ සම්මුඛයෙහි නොසිටිය යුතුය. ඊට සහභාගිවීමට ද නොහැකි විය යුතුය.

13. මණ්ඩලයේ සාමාජිකයකුගේ සභාවේ සමාජිකත්වය අවසන් වුවහොත් හෝ ඉදින් ඔහු සභාපති නමට හෝ ගරු ලේකම් නමට හෝ ලියූ ලිපියකින් ස්වකීය ධූරයෙහි ඉල්ලා අස්වීමට තමාගේ කැමැත්ත දන්වා සිටියහොත් එවිට එම සාමාජිකයාගේ ධූර කාලය අවසන් වන්නේය.

14. (අ) ගරු සභාපති, ගරු ජ්‍යෙෂ්ඨ උප සභාපති, ගරු සම ලේකම්, හෝ ගරු භාණ්ඩාගාරික යන යම් අයෙකු අභාවප්‍රාප්ත වූ විටක දී හෝ ධූරය හැර ගිය විටක දී හෝ ඊළගට පත්වන මණ්ඩලය නිලතල භාර ගන්නා තෙක් අදාළ පරිදි ගරු ජ්‍යෙෂ්ඨ උප සභාපති හෝ ගරු උප සභාපති හෝ ගරු සම ලේකම් හෝ ගරු උප භාණ්ඩාගාරික විසින් එකී පුරප්පාඩුව පිරවිය යුතුය.

(ආ) මණ්ඩලයේ අභ්‍යන්තර සාමාජිකයකු අභාවප්‍රාප්ත වූ විටක දී හෝ තනතුර හැර ගිය විටක දී 14(අ) වැනි ව්‍යවස්ථාව ක්‍රියාත්මක වීමෙන් හෝ වෙනත් හේතුවකින් හෝ පුරප්පාඩුවක් ඇති වූ විට මණ්ඩලය විසින් එකී ධූරයට සාමාජිකයෙකු පත් කළ යුතුයි.

(ඇ) මෙහි 8 වන ව්‍යවස්ථාව ක්‍රියාත්මක කිරීම සඳහා යම් සාමාජිකයෙකු යම් නිශ්චිත ධූරයක් දරා සිටි කාල සීමාව ගණන් බැලීමේ දී මෙම ව්‍යවස්ථාව ක්‍රියාත්මක වීම හේතුවෙන් එම සාමාජිකයා එකී ධූරය දරා සිටි කාල සීමාව නොසලකා හැරිය යුතු අතර ඔහු කලින් යම් ධූරක් දරමින් සිටියේ නම් එම ධූරය මණ්ඩලයේ ඉතිරි නිල කාලය තුළ ද ඔහු දිගටම දරමින් සිටි සේ සැළකිය යුතුය.

15. (අ) මණ්ඩලය යටත් පිරිසයින් මසකට වරක් වත් රැස් විය යුතු අතර මණ්ඩලයේ ඊළග රැස්වීම පැවැත්වෙන දිනය හැකිතාක් දුරට මණ්ඩලයේ එක් එක් රැස්වීම් වාරයක දීම නියම කර ගත යුතුය.

(ආ) සභාපති නියම කළහොත් හෝ මණ්ඩලයේ සාමාජිකයන් හයදෙනෙකු වත් අත්සන් කළ ලිඛිත ඉල්ලීමක් ලත්විට හෝ සභාපති විසින් නිශ්චිතව දන්වා ඇති නැතහොත් ලිඛිත ඉල්ලීමේ නිශ්චිතව දක්වා ඇති යම් කරුණක් සළකා බැලීම සඳහා මණ්ඩලයේ අති විශේෂ රැස්වීමක් ගරු ලේකම් විසින් කැඳවිය යුතුය. එවැනි රැස්වීමක් පැවැත්වෙන දිනය වේලාව සහ ස්ථානය ද රැස්වීමේ දී කරන්නට යන කටයුතු ද මණ්ඩලයේ සියළු සාමාජිකයන්ට යටත් පිරිසයින් පැය 48 කට වත් කලින් දැනුම් දිය යුතුය.

(ඇ) මණ්ඩලයේ රැස්වීමක් සඳහා ගන පූර්ණය (සංස්ථාගත නොවූ සාමාජිකයන් හැර) සාමාජිකයන් හයදෙනෙකු විය යුතුය.

16. (අ) මණ්ඩලයේ/සභාවේ සභාපති ධූරය සහ ආසන්නතම පූර්ව සභාපති ධූරය හැර වෙනත් කවර හෝ ධූරයකට තෝරාපත් කර ගැනීම සඳහා සුදුසුකම් ඇති කවර හෝ සංස්ථාගත සාමාජිකයෙකු ඕනෑම සංස්ථාගත සාමාජිකයන් දෙදෙනෙකු විසින් නම් කරනු ලැබිය හැකිය.

(ආ) ඕනෑම ලියාපදිංචි සාමාජිකයන් දෙදෙනෙකු විසින් හා ඕනෑම ශිෂ්‍ය සාමාජිකයන් දෙදෙනෙකු විසින් පිළිවෙලින් කවර හෝ ලියාපදිංචි සහ කවර හෝ ශිෂ්‍ය සාමාජිකයෙකු 12(අ) වැනි ව්‍යවස්ථාවේ ප්‍රකාර මණ්ඩලයට තෝරාපත් කර ගනු ලැබීම සඳහා නාම යෝජනා ඉදිරිපත් කළ හැකිය.

(ඇ) එම නාම යෝජනා ලිඛිතව තිබිය යුතු අතර යෝජනාකරු හා ස්ථිරකරු ඊට අත්සන් තබා තිබිය යුතු අතර වාර්ෂික සමාජික ගාස්තු හා වෙනත් ගෙවීම් වෙතොත් එම සියළු ම මුදල් ගෙවා ඇති බව තහවුරු කල යුතුය. තවද අදාළ ව්‍යවස්ථා අනුව තෝරාපත් කර ගනු ලැබීම සඳහා තමාට සුදුසුකම් ඇති බවටත් තෝරාපත් කර ගනු ලැබුව හොත් මණ්ඩලයට අයත්ව සේවය කිරීමට තමා කැමැත්ත ප්‍රකාශ කරන බවටත් අපේක්ෂකයා විසින් අත්සන් කරන ලද ප්‍රකාශයක් ද ඊට අඩංගු විය යුතුය.

(ඈ) තෝරාපත් කර ගැනීම සඳහා යටත් පිරිසයින් දින 15කට වත් පෙරාතුව එම නාම යෝජනා ගරු ලේකම්වරයා වෙත භාර දිය යුතුය.

(ඉ) මණ්ඩලය විසින් එහි අවසාන රැස්වීම් වාරයේදී සභාපති හා ආසන්නතම පූර්ව සභාපති ධූරය හැර මණ්ඩලයේ එක් එක් ධූරයක් සඳහා එක් එක් අපේක්ෂකු බැගින් යෝජනා ස්ථිරත්වයෙන් නම් කළ හැකිය. අදාළ ව්‍යවස්ථාවල ප්‍රකාර තෝරාපත් කර ගැනීම සඳහා තමාට සුදුසුකම් ඇති බවටත් තෝරාගනු ලැබුවහොත් මණ්ඩලයට අයත්ව සේවය කිරීමට කැමති බවටත් එම අපේක්ෂකයා එසේ නම් කරනු ලැබීමට ඉහතින් හෝ සති දෙකක් ඇතුළත හෝ ප්‍රකාශයක් ලියා අත්සන් කර ඇතොත් මිස එවැනි නාම යෝජනාවක් වලංගු නොවනු ඇත.

17. (අ) වාර්ෂික මහා සභාව පිළිබඳ දැන්වීමට 16 වැනි ව්‍යවස්ථාවේ ප්‍රකාර නාම යොජනා කරනු ලැබ ඇති සියළු අපේක්ෂකයන්ගේ නාම ලේඛනයක් ද ඇතුළත් විය යුතුය.

(ආ) පවත්නා ලිත් වර්ෂය වෙනුවෙන් තමාගෙන් අය වියයුතු දායක මුදල් කලින් ගෙවා ඇතොත් මිස කිසිම සාමාජිකයෙකුට ඡන්දය ප්‍රකාශ කිරීමට හිමිකම් නොලැබෙනු ඇත.

(ඇ) නිලධාරී මණ්ඩලය තෝරාපත් කර ගැනීම වාර්ෂික මහා සභාවේ න්‍යාය පත්‍රයේ සඳහන් මුල්ම කාර්යය විය යුතුය. ඡන්දය ප්‍රකාශ කළ යුත්තේ රහස් ඡන්ද ක්‍රමයකටය.

(ඈ) ඡන්ද පත්‍රිකා පිළියෙල කිරීම හා නිකුත් කිරීම ඡන්ද පෙට්ටි සැපයීම හා ඡන්ද ගණන් කිරීම (තෝරා ගත් සභාපති වන) ජ්‍යෙෂ්ඨ උප සභාපති සතු වගකීම වන අතර යම් නාමයෝජනා පත්‍රයක වලංගුභාවය යම් අපේක්ෂකයකුගේ යෝග්‍යතාව ඡන්දය ප්‍රකාශ කිරීමට යම් සාමාජිකයකුට ඇති අයිතිය යන මේ කරුණු සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය විය යුතුය. ධූර අපේක්ෂකයන් නොවන අධි සාමාජිකයන් දෙදෙනෙකුට නොවැඩි සංඛ්‍යාවක් ඔහු විසින් තමාට සහය වීම සඳහා පත් කර ගත හැකිය.

(ඉ) එක් ධූරයකට වැඩිගණනක් සඳහා එක් අපේක්ෂකයෙකු නම යොජනා කළ හැකිය. එහෙත් එක් ධූරයකට තෝරාපත් කරනු ලැබුවහොත් වෙනත් ධූරයත් සඳහා ඔහුට දෙන ලද ඡන්ද නොසලකාහැරිය යුතුය. මේ ව්‍යවස්ථාව ක්‍රියාත්මක කිරීමේ දී ජ්‍යෙෂ්ඨ උප සභාපති, උප සභාපති, ගරු සම ලේකම්, ගරු භාණ්ඩාගාරික, ගරු උප භාණ්ඩාගාරික යන අනෙකුත් ධූර සඳහා දෙන ලද ඡන්ද ගණන් කළ යුත්තේ එකී අනුපිළිවෙලටය.

18. සභාවේ මුදල් වර්ෂය ජනවාරි 01 වැනිදා සිට දෙසැම්බර් 31 වැනිදා දක්වා විය යුතුය.

19. මණ්ඩලයේ සාමාජිකයින් තමන් තෝරා පත් කර ගන්නට යෙදුනු වාර්ෂික මහා සභාව පැවැත්වුණු දිනයේ සිට තම අනුප්‍රාප්තිකයන් තෝරාපත් කර ගන්නා වාර්ෂික මහා සභාව පැවැත්වෙන දිනය දක්වා ධූරය දැරිය යුතුය.

20. (අ) සභාවේ සාමාජිකයින්ගේ වාර්ෂික මහා සභාව සෑම වර්ෂයකම මාර්තු මාසය අවසානයට මත්තෙන් පැවැත් විය යුතුය. වාර්ෂික මහා සභාවේ න්‍යාය පත්‍රයට පහත සඳහන් කටයුතු ඇතුළත් විය යුතුය.

- නිලධාරී මණ්ඩලය සහ මණ්ඩලයේ කාරක සභා සාමාජිකයින් තෝරාපත් කර ගැනීම.
- ඉකුත් වර්ෂය සඳහා වූ වාර්ෂික වාර්තාව සහ විගණනය කළ ගිණුම් ප්‍රකාශය සම්මත කර ගැනීම සහ
- විධි වූ පරිදි කලින් දැනුම් දී ඇති අනෙකුත් කටයුතු

(ආ) වාර්ෂික මහා සභාව සහ මහ සභා රැස්වීමක් පැවැත්වෙන දිනය, වෙලාව සහ ස්ථානය දින දහයකටවත් පෙර සියළු සාමාජිකයන්ට දැනුම් දිය යුතුය.

(ඇ) වාර්ෂික මහා සභාව මාර්තු මස අවසානයට පෙර නොපැවැත්වුවහොත් වාර්ෂික මහා සභාව කැඳවා එහි සියළු කටයුතු කරගෙන යාමට විධි විධාන සැලසීම වස් මෙහි 21 වැනි ව්‍යවස්ථාවේ නියම කර ඇති ප්‍රකාර සභාවේ සාමාජිකයින්ගේ විශේෂ මහා සභා රැස්වීමක් කැඳවිය යුතුය.

(ඈ) වාර්ෂික මහා සභාවට අමතරව සභාවේ සාමාජිකයින්ගේ මහා සභා රැස්වීම් තුනක්වත් පැවැත්වීමට මණ්ඩලය කටයුතු සැලැස්විය යුතුය.

21. (අ) ගරු සභාපති නියම කළහොත් හෝ සංස්ථාගත සාමාජිකයින් පහළොස්දෙනෙකුවත් අත්සන් කළ ලිඛිත ඉල්ලීමක් ලැබුණු සාමාජිකයිනට සභාපති නිශ්චිතව දක්වා ඇති නැතහොත් ලිඛිත ඉල්ලීමේ නිශ්චිතව සඳහන් කර ඇති යම් කරුණක් සලකා බැලීම සඳහා සභාවේ සාමාජිකයින්ගේ විශේෂ මහා සභා රැස්වීමක් ගරු ලේකම් විසින් කැඳවිය යුතුය.

(ආ) එවැනි රැස්වීම් පැවැත්වෙන දිනය, වෙලාව සහ ස්ථානය ද, රැස්වීම් කටයුතුවල ස්වභාවය ද යටත් පිරිසෙයින් දින තුනකටවත් කලින් සියළු සාමාජිකයින්ට දැනුම් දිය යුතුය.

22. (අ) සභාවේ සාමාජිකයින්ගේ සියළු රැස්වීම්වලදී ගරු සභාපති මුලසුන දැරිය යුතුය. ඔහු පැමිණ නැතහොත් ගරු ආසන්නතම පූර්ව සභාපති, ගරු ජ්‍යෙෂ්ඨ උප සභාපති හෝ ගරු උප සභාපති ද ඔවුන් පැමිණ නැතහොත් පැමිණ සිටින සාමාජිකයින් විසින් පත් කරනු ලබන පාලක මණ්ඩලීය සාමාජිකයෙකු ද මුලසුන දැරිය යුතුය.

(ආ) සභාවේ සාමාජිකයින්ගේ රැස්වීමක් සඳහා ගණ පූරණය සංස්ථාගත සාමාජික සංඛ්‍යාවෙන් හතරෙන් එකකි. රැස්වීම පැවැත්වීමට නියමිත වේලාවේ සිට පැය භාගයක් ඇතුළත ගණ පූර්ණයක් ඇති නොවුනහොත් රැස්වීම කල් තබා, එසේ කල් තබන ලද රැස්වීම සඳහා නියමිත වේලාවේ සිට පැය භාගයක් ඇතුළත ගණ පූරණයක් ඇති නොවුනහොත් පැමිණ සිටින සංඛ්‍යාව ගණ පූරණය විය යුතුය.

(ඇ) සංස්ථාගත නොවූ සාමාජිකයන්ගේ සියළු රැස්වීම්වලට පැමිණ සහභාගීවිය හැකි නමුත් මෙහි දොළොස්වන ව්‍යවස්ථාව නියම කර ඇති අන්දමට පමණක් ඔවුන් ඡන්දය ප්‍රකාශ කළ යුතුය.

23. (අ) මණ්ඩලය විසින් අධ්‍යන මණ්ඩලයක් පත් කළ යුතු අතරම මණ්ඩලයේ අරමුණුවලට හෝ මණ්ඩලය සතු කාර්යවලට හෝ සම්මත යම් යම් විශේෂිත කරුණු ගැන උපදෙස් දීම සහ සහායවීම සඳහා මණ්ඩලය සුදුසු යැයි අදහස් කරන අන්දමට වෙනත් මණ්ඩල හෝ කාරකසභා ද පත් කළ හැකිය.

(ආ) පනතේ 3(අ), (ආ) සහ (ඉ) යන වගන්තිවල නියම කර ඇති පරිදි ශිෂ්‍යයන්ගේ පුරාවිද්‍යා අධ්‍යපනය පිළිබඳවත් විභාග පැවැත්වීම හා ඊට සියළු කරුණු පිළිබඳවත් අධ්‍යයන මණ්ඩලය ක්‍රියා කළ යුතුය. සභාවේ සභාපති නිල බලයෙන් අධ්‍යයන මණ්ඩලයේ සාමාජිකයෙකු විය යුතුය.

(ඇ) සභාවේ සාමාජිකත්වය සඳහා සුදුසුකම් ලැබීමේ විභාගවලට පාඨමාලා පැවැත්වීමත් එම විභාග පැවැත්වීමත් මණ්ඩලය විසින් අධ්‍යයන මණ්ඩලයට පැවරිය හැකිය.

24 පුරාවිද්‍යාවේ වැඩි දියුණුව සඳහා ඒ ඒ වර්ෂය තුළ සපුරා ඉටු කරන ලද විශිෂ්ටතම මෙහෙය වෙනුවෙන් සභාව විසින් වාර්ෂිකව රන් පදක්කම් පිරිනැමිය හැකිය.

### උපලේඛනය 1

***සාමාජික මුදල් හා ගාස්තු***

| *සාමාජිකත්වය* | *ඇතුල්වීමේ ගාස්තු* | *වාර්ෂික සාමාජික මුදල* |
|---|---|---|
| | *රු. ශ.* | *රු. ශ.* |
| අධි සාමාජික | 750.00 | 750.00 |
| සාමාජික | 500.00 | 500.00 |
| ආශ්‍රිත සාමාජික | 250.00 | 250.00 |
| ලියාපදිංචි සාමාජික | 100.00 | 100.00 |
| ශිෂ්‍ය සාමාජික | 50.00 | 50.00 |

### උපලේඛනය 2

***සාමාජිකත්වය ලැබීමට සුදුසුකම්***

1. ශ්‍රී ලංකා පුරාවිද්‍යා සභාවේ අධි සාමජිකයෙකු ලෙස ලියාපදිංචිවීමේ සුදුසුකම් -

(අ) දස වර්ෂාධික කාලයක් තුළ සභාවේ සාමාජිකයෙකු ලෙස සාමාජිකත්වය දරා තිබීම.

2. ශ්‍රී ලංකා පුරාවිද්‍යා සභාවේ සාමාජිකයෙකු ලෙස ලියාපදිංචිවීමේ සුදුසුකම් -

(අ) පිළිගත් විශ්වවිද්‍යාලයක හෝ ආයතනයක පුරාවිද්‍යාව* පිළිබඳ පශ්චාත් උපාධියක් හා අධි සාමාජිකයෙකුගේ අධීක්ෂණය යටතේ සුදුසු රාජ්‍ය හෝ පෞද්ගලික ආයතනයක වෘත්තීය පුරාවිද්‍යාඥයකු වශයෙන් දෙවසරක පළපුරුද්දක් ලබා තිබීම පළපුරුද්ද ලබා ගැනීම පශ්චාත් උපාධිය ලබා ගැනීමට පෙර හෝ ලබා ගැනීමෙන් පසු හෝ කල හැකිය.

3. ශ්‍රී ලංකා පුරාවිද්‍යා සභාවේ සහාය සාමජිකයෙකු ලෙස ලියාපදිංචිවීමේ සුදුසුකම්-

(අ) පුරාවිද්‍යාව* පිළිබඳ විශේෂ උපාධියක් හා ලියාපදිංචි සාමාජිකයෙකු වශයෙන් වසර පහක් සේවය කර තිබීම හෝ

(ආ) පුරාවිද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධියක් ලබා තිබීම හෝ

(ඇ) ශ්‍රී ලංකා පුරාවිද්‍යා සභාව විසින් පවත්වනු ලබන වෘත්තීය පරික්ෂණයෙන් සමත්වීම.

4. ශ්‍රී ලංකා පුරාවිද්‍යා සභාවේ ලියාපදිංචි සාමජිකයෙකු ලෙස ලියාපදිංචිවීමේ සුදුසුකම් -

(අ) ශිෂ්‍ය සාමාජිකයෙකු වශයෙන් පස් වසරක් සේවය කර තිබීම හෝ

(ආ) අධි සාමජිකයෙකු හෝ සාමජිකයෙකුගේ අධික්ෂණය යටතේ සුදුසු රජයේ හෝ පෞද්ගලික ආයතනයක වෘත්තීය හෝ තාක්ෂණ මට්ටමින් දසවසරක පළපුරුද්දක් ලබා තිබීම. *

5. ශ්‍රී ලංකා පුරාවිද්‍යා සභාවේ ශිෂ්‍ය සාමජිකයෙකු ලෙස ලියාපදිංචි වීමේ සුදුසුකම් -

(අ) පුරාවිද්‍යාව* පිළිබඳ විශේෂ උපාධි පාඨමාලාවක් හෝ පුරාවිද්‍යාව* විෂයක් වශයෙන් ඇතුළත් සාමාන්‍ය උපාධි පාඨමාලාවක් සඳහා ඇතුළු වී තිබීම.

හෝ

පුරාවිද්‍යාව* පිළිබඳ පශ්චාත් උපාධි පාඨමාලාවක් සඳහා ඇතුළු වී තිබීම.

* සමහර ආයතන හෝ සම්ප්‍රදායන් මගින් පුරාවිද්‍යාව අධ්‍යයනය වෙනත් නම් හෝ විග්‍රහ මගින් හඳුන්වනු ලබයි. මෙවැනි විකල්ප නම් හෝ විග්‍රහ පුරාවිද්‍යාවට සමාන කිරීම් පිළිගනු ලැබීම එක් එක් පෞද්ගලික ඉල්ලුම්පත් මත පාලක මණ්ඩලය විසින් කරනු ලබන අර්ථකථනය මත සිදු කෙරේ.

# වෘත්තීය පුරාවිද්‍යාඥයකු යටතේ තාක්ෂණික මට්ටමේ ක්‍රියා කිරීම යනුවෙන් අදහස් කරනුයේ පුරාවිද්‍යාවට අදාළ වැදගත් සහාය කාර්යයන් වන සැලසුම්කරණය, තලමිතිය, ඡායාරූප ශිල්පය, හමුවූ දෑ විශ්ලේෂණය සහ සභාව විසින් විටින් විට පිළිගනු ලබන පුරාවිද්‍යා ක්ෂේත්‍රයට අයත් වෙනත් සමාන කාර්යයන් හි නිරත වීම වේ.

02 - 711

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.